# පුරාවිද්‍යා සංරක්ෂණ මූලධර්ම ගඩොල් සංරක්ෂණ ක්‍රමවේදය තුළ භාවිතයට ගෙන ඇති ආකාරය (ඓතිහාසික පොළොන්නරු නගරයේ ස්තූප ඇසුරින්)

ඩබ්ලිව්.එම්.දිල්කා නිශාදි*

පැරණි ස්මාරකයන්ගේ නිර්මිත අමුද්‍රව්‍ය විවිධ ස්වරූපයන් ගනු ලබයි. ශ්‍රී ලංකාව තුළ කළුගල්, ගඩොල්, පස්, දැව යන මාධ්‍යයන් ඔස්සේ පැරණි ස්මාරකයන් නිර්මාණය කර ඇති අයුරු හඳුනාගන්නට හැකිය. මෙම නිර්මාණයන් සඳහා සර්ම කලාපීය ප්‍රදේශයන්හි බහුලව භාවිතයට ගෙන ඇති අමු ද්‍රව්‍යක් වශයෙන් ගඩොල් හඳුනාගත හැකිවේ. ගඩොල් ස්මාරක සංරක්ෂණය තුළ මූලික වශයෙන් අවබෝධ කරගතයුතු කරුණ වන්නේ එම ස්මාරකයන් සංරක්ෂණයට පෙර, සමකාලීන ආරක්ෂණ ක්‍රමවේද හා සිදුකළ යුතු නූතන සංරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳවය. ගඩොල් ස්මාරක සංරක්ෂණය පිළිබඳව මූලික හැඳින්වීමක් ඔස්සේ ස්මාරක සංරක්ෂණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ද සංරක්ෂණ ක්‍රියාවලිය තුළ වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ එළිමහන් කලාපීයව ගඩොල් ස්මාරක සංරක්ෂණය පිළිබඳව හොඳම නිදර්ශනයන් සපයනුයේ පොළොන්නරුව පැරණි නගරයයි. ක්‍රිස්තු පූර්ව 6 වන සියවස තරම් දක්වා ඈත අතීතයට උරුමකම් කියන පොළොන්නරු රාජධානිය එකොළොස්වන සියවසේ සිට දහතුන්වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන අග නගරය බවට පත්විය. පැරණි පොළොන්නරු නගරය නූතනය වනවිට අක්කර 300 ක පමණ ප්‍රදේශයක පැතිර පවතී.

පොළොන්නරුව පුරා පැතිර පවතින ගඩොල් ස්මාරක අතුරින් ස්තූප මගින් සංරක්ෂණයේ ස්වරූපය හඳුනා ගැනීමට පුළුවන. මෙම යුගයේ ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය පිළිබිඹු කරනා වූ නිර්මාණාංගයක් වශයෙන් ස්තූප හැඳින්විය හැකිය. බුබ්බුලාකාර, කොට වෙහෙර සහ පිරමීඩාකාර යන වර්ගයන් පොළොන්නරුවෙහි ස්තූප ස්වරූපයන් වේ. රන්කොත් වෙහෙර, කිරිවෙහෙර, දෙමළ මහා සෑය, පබළු වෙහෙර සහ මැණික් වෙහෙර යන ස්තූපයන් වැනි ගඩොල් ස්මාරකයන් ඇසුරෙන් මූලික පුරාවිද්‍යාත්මක කටයුතු ඇතුළුව සංරක්ෂණ ප්‍රවේශය, සංරක්ෂණයේ ස්වරූපය, සංරක්ෂණ ක්‍රමවේ ද යනාදිය අධ්‍යයනයට ලක්කළ හැකිවේ. උරුම සංරක්ෂණය කෙරෙහි මූලික අවධානයක් යොමු කරමින් සංරක්ෂණ කාර්යයභාරය හඳුනාගැනීම පර්යේෂණයේ අපේක්ෂිත අරමුණයි. මෙහිදී අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්තයන් ඔස්සේ කරුණු ගොනු කිරීම සිදුකර ඇත.

ප්‍රමුඛ පද : ගඩොල්, සංරක්ෂණය, පොළොන්නරුව, ස්තූප

* පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය